# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2129/68 – 2019 ජුනි 26 වැනි බදාදා – 2019.06.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව නැගෙනහිර සුළු කොට්ඨාසයේ, පාතේගම මධ්‍යම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/ඩීකේඩබ්ලිව්/2015/517 හා 2016.02.16 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – රබර්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0340**

උතුරට: මාතර, කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කර ගෙන ඇති ඉඩම; නැගෙනහිරට: කැබලි අක්ෂර බී, හිමිකරු සොයාගත නොහැකි කෝන්ගහකොරටුව හෙවත්, පාළුවත්ත සහ සුගතපාල පලිහක්කාර හිමිකම් කියන රබර්වත්ත; දකුණට: සුගතපාල පලිහක්කාර හිමිකම් කියන රබර්වත්ත; බටහිරට: දළුගම ගමගේ පියසේන හිමිකම් කියන කරඳගොඩ සහ මාතර කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කරගෙන ඇති ඉඩම.

02. **කැබලි අක්ෂර 'බී' – කෝන්ගහකොරටුව හෙවත් පාළුවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0222**

උතුරටඃ මාතර කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කරගෙන ඇති ඉඩම; නැගෙනහිරටඃ ඩී. එච්. පලිහක්කාර හිමිකම් කියන රබර්වත්ත සහ හිමිකරු සොයාගත නොහැකි කෝන්ගහකොරටුව හෙවත් පාළුවත්ත; දකුණටඃ හිමිකරු සොයාගත නොහැකි කෝන්ගහකොරටුව හෙවත් පාළුවත්ත; බටහිරටඃ කැබලි අක්ෂර ඒ සහ මාතර කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කරගෙන ඇති ඉඩම.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය : 4-3/11/2015/එන්ආර්ඩී/14.
2019 මැයි මස 07 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 323


1A – G30393– 18 (2019/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*